# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ලංකාවේ අරංචිපත්‍රයක් මෙන් ලියාතබනලදී.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිඬකරණලදී.

**නො. 6,914 — 1917ක්වූ දෙසැම්බර් මස 7වෙනි දිනවූ සිකුරාදා.**


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## උපාඬගනීති.

### වර්‍ෂ 1898වේ නගරාභිවෘඬික සභා ආඥාපණතයි.

වර්‍ෂ 1915ක්වූ සැප්තැම්බර් මස 10වෙනි දින දාතම දරණ නොම්මර 6,739 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කරණලද, මාතර නගරාභිවෘඬික සභාව විසින් සාදනලද වර්‍ෂ 1915ක්වූ සැප්තැම්බර් මස 2වෙනි දින දාතම දරණ 1898වේ 13වෙනි ආඥාපණතේ 57වෙනි කාණ්ඩයේ ප්‍රකාර පාන්ගෙවල් සම්බන්ධ උපාංගනීති, එකී නගරාභිවෘඬික සභාව විසින් අවලංගු කිරීමද ඒ වෙනුවට සාදනලද පාන්ගෙවල් සම්බන්ධ මෙහි පහත පෙණෙන උපාංගනීතිද, ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාගත ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිර කරණලද බව මෙයින් ප්‍රසිඬකරන්ට යෙදුනා ඇත.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්‍ෂ 1917ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්භ.

### පාන්ගෙවල් සම්බන්ධවූ උපාංගනීති.

1. "පාන්ගෙය" යන්නෙන් මනුෂ්‍යයාගේ ආහාර පිණිස විකිණීමට පාන්, බිස්කෝත්තු හෝ පැණිරස කැවිලිවර්ග සාදන ඕනෑම ස්ථානයක් හඟවයි. තවද එබඳු ආහාර සෑදීමට සූදානම්කරනු ලබන හෝ එබඳු ආහාර සූදානම්කිරීමට උවමනා ද්‍රව්‍ය රැස්කර තබන්නාවූ හෝ කවර ස්ථානයක් වූවත් ඊට අන්තර්ගතවේ.

2. සභාපතිතැනගෙන් අවුරුදුපතා ගන්නාලද බලපත්‍රයක් නොමැතිව කිසිවකුටත් පාන්ගෙයක් තබන්නට බැරිය. එම බලපත්‍රය එහි අන්තිම දිනය වන දෙසැම්බර් මස 31වෙනි දින දක්වා හෝ එම බලපත්‍රය අවලංගුකරනු ලබනතුරු පාවිච්චිකළ හැකිය. මේ අණපනත්වලට අනුව ක්‍රියාකිරීම අතපසුකරණ කාටවූවත් එම බලපත්‍රය දීම ප්‍රතික්‍ෂෙපකිරීමට සභාපතිතැන කෙරෙහි බලය පවරනලදී. එබඳු බලපත්‍රය මන්ත්‍රණ සභාගත ආණ්ඩුකාරතැනගේ කැමැත්ත ඇතිව (ලෝකල්බෝඩ්) නාගරික සභාව විසින් අරමුනු කරනුලබන ගාස්තු ගෙවීමට වැඩිදුරටත් බැඳීතිබේ.

3. යම් කෙනෙක් යම් විනිශ්චය ශාලාවකදී දෙවිතාවක් හෝ ඊට වැඩි වාර ගණනාවක් මේ අණපනත් කඩකිරීම ගැන දඬුවම් කරනුලබන්නේ නම් එබඳු දෙවෙනි තඬුව ලියා තබන විනිශ්චයශාලාව මගින් මේ පරිච්ඡෙදය යටතේ "ලෝකල්බෝඩ්" සභාපතිතැන විසින් ඒ අයට නිකුත්කරණලද එවැනි බලපත්‍රය අවලංගුකිරීම ව්‍යවස්ථානුකූලවේ. විනිශ්චයශාලාවකදී බල පත්‍රයක් එසේ අවලංගු කලවිට එම අයට යම්කිසි අලුත් බලපත්‍රයක් නිකුත්කිරීම සභාපතිතැනගේ කමැත්තේ ප්‍රකාර ප්‍රතික්‍ෂෙප කිරීමට (ලෝකල්බෝඩ්) නගර සභාවේ සභාපතිතැනට මෙයින් බලය දෙනලදී.

4. පාන්පිටි අනන ගෙයක ඉතා අඩු ගණනේ දිග අඩි 15කින් හා පළල අඩි 12කින් සම්පූර්ණ වියයුතුය. ගෙය පුරා වාතය වැදගන්නා පිණිස අඩු ගණනේ දෙපාර්ශ්වයකින්වත් පළලින් අඩි හතකට අඩුනොවන අවකාශ ස්ථාන පිටතින් ඇති විය යුතුයි. පෝරනුවේ දොර පිටි අනන ගෙය කෙළින් නොදැමිය යුතුයි. පිටි අනන සියලු ගෙවලම (සීලිං) වියන්තට්ටුවක් බැගින් තැනිය යුතුයි.

5. සියලු පාංගෙවලම වාතාශ්‍රය හා ආලෝකය යහපත් අන්දමට ඇතිවිය යුතුය. සියලු කොටසෙහි භිත්ති උස අඩි හතකට අඩුනොකොට ගඩොලින් හෝ ගලින් හෝ කබුක්ගලින් බැන්ද යුතුය. එහි ඇතුළ හුනුපදලමින් නිමවා හමාසයකට වරක් සුදුහුනු ගෑයුතුය. බොහෝකල් පවතින ද්‍රව්‍යයකින් පියසි සෑදිය යුතුය. අවුරුදු හතරකට වරක් වියන්තට්ටු අලුත් වැඩියාකර සුදුහුනු ගෑයුතුයි. නැතහොත් ලෑලි ඔප්තුකොට වද්ද සායම් හෝ තීන්ත හෝ ගෑයුතුයි. ගෙබිම හැම තැනම සිමෙන්ති පදලම දමා සෑහෙන පමණ කාණු සෑදිය යුතුය. සියලු ගබඩාවලම දොර බියලි විවරකළහැකිවූ ගෙබිමේ ප්‍රමාණ යෙන් $\frac{1}{16}$ පංගුවකට අඩුනොවන සම්පූර්ණ විශාලත්වයක් ඇතිවූ ජනෙල තැබිය යුතුය.

6. පාන් සහ කැවිලි සෑදීමට ගන්නා හැම භාජනම ඉතා පිරිසිදු අන්දමට තැබිය යුතුයි. තවද ඒවා ගෙයි බිම ශුඬ කරනවිට ඉවත්කළහැකි වියයුතුයි.

7. අඩුගණනේ විසිහතරපැයකට වරක් බැගින්වත් ගෙයි බිම පරීක්‍ෂා ඇතිව සූරා ඇමැන්ද යුතුය. තවද ඒ කැළි කසළ දියකාන්දු නොවන භාජනයකට එවිගසම දමා දිනපතා පාන් ගෙයින් පිටකළ යුතුය.

8. පාන් ගෙවල් සියල්ලම පිරිසිදුලෙස තැබිය යුතුය. තවද කාණුවලින් හෝ වැසිකිළිවලින් හෝ වෙනත් කුණු කස ළින් නැගෙන අශුබ වාතයෙන් තොරවිය යුතුය.

9. කිසිම පාන් ගෙයක් වැසිකිළියකින් හෝ පෝරගොඩකින් නොවසනලද කුණු වළකින් අඩි පනහක් ඇතුළත නොතැබිය යුතුයි.

10. පාන් සෑදීමට වුවමනාවූ ද්‍රව්‍ය හැර වෙන කිසිම බඩුවක් හෝ ද්‍රව්‍යයක් පාන්ගෙය තුළ නොතැබිය යුතුයි.

11. මේසවල මුදුන් හොඳකාර මෝරාපු සෙත්තු වද්දනලද ලෑලිවලින් හෝ අනතුරය නැති දිය කාන්දු නොවන වෙන යම් ද්‍රව්‍යයකින් හෝ සෑදිය යුතුයි. තවද ඒවා දවස්පතා සූරා ශුද්ධකළ යුතුයි.

12. කවර කරුණක් නිසාවත් කිසිම සතෙක් පාන් ගෙයක තබාගත යුතුනොවේ.

13. බෝවෙන ලෙඩකින් පෙළෙන්නාවූ හෝ පාන්ගෙය භාරකාරයාගේ දැනීම ඇතිව බෝවෙන ලෙඩකින් ලඟදී පෙළෙමින් සිටියාවූ හෝ එවැනි ලෙඩකින් පෙළෙන අයෙකුට සාත්තුකිරීමෙහි ලඟදී යෙදී සිටියාවූ හෝ කෙනෙකුට පාන් ගෙයට ඇතුල්වීමට හෝ පාන් සෑදීමට හෝ අවට විකිණීමට හෝ පාන් ගෙය භාරකාරයා විසින් ඉඩනොදිය යුතුයි.

14. පාන් සෑදීමේ හෝ පිලිස්සීමේ යෙදීසිටින සියලුදෙනාම පාන් සෑදීමට පටන්ගන්නට පළමුකොට දෑඅත් සෝදා පපුව සහ ශරීරය වැසෙනසේ පිරිසිදු සුදුවැස්මක් හෙවත් සැට්ටයක් හැඳ සුදු තලප්පාවක් හෝ තොප්පියක් හෝ හිස දමාගත යුතුය.

15. පාන් විස්කෝත්තු හා මිහිරි රසකැවිලි සෑදීමෙහි යෙදීසිටින්නන්ගේ ප්‍රයෝජනය පිණිස හොඳ වතුර සහ සබන් සපයා තැබිය යුතුයි.

16. විකිණීමට තබන සියලුම පාන් විස්කෝත්තු හා රසකැවිලි වැනි මැස්සන්ට ඇතුළුවිය නොහැකිලෙස තනනලද විදුරුපෙට්ටිවල තැබිය යුතුයි. පෙට්ටි ඉතාමත් පිරිසිදු අන්දමට තැබිය යුතුයි.

17. පාන් සෑදීමට වුවමනා පිටිවතුර ආදිවූ සියලු ද්‍රව්‍ය යහපත් ඒවා වියයුතුයි. තවද බිමින් අඩි තුනකට අඩු නොකොට සාදනලද උස් ඉඩමක පිටි තැබිය යුතුයි.

18. පාන් පුලුස්සන ගෙවලට අයිති බිදුල්වල කැළිකසළ සියල්ලම දවස්පතා ඉවත්කළ යුතුයි. කාණු සියල්ලක්ම හොඳකාර සේදිය යුතුයි.

19. පාන්ගෙයි මට්ටමට ඇත්තාවූද එම ගොඩනැගිල්ලේ කොටසක්වූද, කිසිම ස්ථානයක බිම පටන් වියන්තට්ටුව දක්වා පැතිර තිබෙන ක්‍රමයකින් පාන්ගෙයින් නිසි විධියට වෙන්කර නැත්නම් එය නිදාගැනීමට නොගත යුතුයි. මුත්‍රා කොටුවක් හෝ වැසිකිළියක් හෝ අළුවළක් හෝ පාන්ගෙය තුළ හෝ ඊට සම්බන්ධකොට හෝ නොතැබිය යුතුයි.

20. සියලු සුදුසු වේලාවලටද පාන් පිලිස්සීම කරන්නාවූ ඕනෑමවිටකටද පාන්ගෙට හෝ පාන් විකිණීමට තබා තිබෙන්නාවූ ස්ථානය ප්‍රවේශව "ලෝකල් බෝඩ්" සභාවේ පරීක්ෂකතැන විසින් හෝ ප්‍රධානතැන විසින් ලියමනකින් බලය දෙනලද වෙන කෙනෙකු විසින් හෝ පරීක්ෂාකරන්නට නීතියේ ආකාර බලය තිබේ.

21. මේ අණපණත්වල පිටපතක් රාමුවක දමා සියලු පාන්ගෙවලම පෙනෙන තැනක එල්ලා තැබිය යුතුයි.

---

වර්ෂ 1892කේ අවුරුද්දේ නොම්මර 18වේ ආඥාපණතේ 9E (2) (*d*) උප වගන්තිවල ප්‍රකාර රත්නපුරේ සනීපාරක්ෂක සභාව විසින් සාදනලද පහත සඳහන්වන අතුරුපණත් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ කැමැත්ත පිට ස්ථිරකරනලද බව මෙයින් දැනගත යුතුයි.

ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වෙනුවට.

### ඉහත සඳහන්කළ අතුරුපණත්.

1. සනීපාරක්ෂක සභාවේ සීමාව ඇතුළත කිරි විකුණන්නාවූ සියලුම පට්ටිකාරයෝ ඔවුන්ගේ නම් සහ පදිංචි ස්ථානද, පට්ටියක් තැනීමට යෝජනාකරණලද ඉඩමේ නමද, ඔවුන්ගේ වැඩකරුවන්ගේ නම් සහ පදිංචි ස්ථානද, සනීපාරක්ෂක සභාවේ කන්තෝරුවෙන් ලියවිල්ලකින් ඉල්ලා ලියාපදිංචි නොකර කිරි විකුණන්නාවූ හෙවත් විකිණීම පිණිස තබාගන සිටින්නාවූ යම් කෙනෙක් වැරදිකාරයෙක් වෙනවා ඇත.

1A. සෑම පට්ටිකාරයෝ වැඩිමනත්ව පහත සඳහන් රෙගුලාසි පිළිපැදිය යුතුයි.

2. වැසිකිළියක් හෝ කක්කුස්සි වළකට යාර 50ක් මෙපිට හෝ වැසිකිළියකින් හමන්නාවූ දුර්ගන්ධය ඇති ස්ථානයක කිරිපට්ටියක් තබාගැනීමට තහනම්ය.

3. ලෝකල්බෝඩ් සභාවේ ප්‍රධානතැනට සතුටුදායක පරිද්දෙන් කිරිපට්ටි ඇති ස්ථානවල සෑම මිදුල්වලටම කාණු තිබෙන්ට ඕනෑවාත්හැර එම කාණු නොකඩවම සෝදා පිරිසිදුව තැබිය යුතුයි. කිරිපට්ටියක් ඇති ස්ථානවල මිදුලක පල්වතුර තිබෙන්ට ඉඩදෙනු නොලැබේ.

4. කිරිපට්ටියක හෝ අවට ඇති කුණු කසල අප්‍රමාදව අහක්කළ යුතුයි. දවස්පතාම පට්ටියෙන් ගොම අරන් දමන්නට ඕනෑය.

5. කිරිපට්ටියට නුදුරුවූ තැනක පිරිසිදු ජලාශයක් තිබෙන්ට ඕනෑය. කිරිපට්ටියේ මිදුලක තිබෙන ලිඳක නාන්ට හෝ රෙදි සෝදන්ට ඉඩදෙනු නොලැබේ.

6. කිරිපට්ටියක් වශයෙන් පාවිච්චිකරනලද ගොඩනැගිල්ලක් මනුෂ්‍ය වාසයට හෝ වෙන කිසියම් දෙයකට පාවිච්චි කිරීමට හෝ එසේ කිරීමට ඉඩදිය යුතුනොවේ. නිරතුරුම එවැනි ගොඩනැගිලි පිරිසිදුව තබාගත යුතුයි.

7. කිරි එළදෙනුන්ට කිසිම ලෙඩක් නැතුව සිටින්ට ඕනෑය. තවද පට්ටිකාරයෝ සහ ඔවුන්ගේ වැඩකරුවෝද බෝවෙන වසංගත රෝගවලින් තොරව සිටිය යුතුයි.

8. කිරිපට්ටියක පාවිච්චිකරන හෝ ඊට අයත් භාජන ලිබඩු ආදි වෙනත් වුවමනා උපකරණ පිරිසිදුව තබාගත යුතුයි.

9. කිරි ගෙනියන්නාවූ භාජනවලට නිසි පියන්පතක් තිබෙන්ට ඕනෑය. නැතහොත් ඒවා කිරි උරානොගන්නාවූ යමකින් වසාගන යන්ට ඕනෑය. එපමණකුත් නොව ඒවා කිහිල්ලේ තබාගන ගෙනියන්ට තහනම්ය.

10. වතුර හෝ වෙන කිසි යමක් දමා බාලකරනලද කිරි විකිණීම හෝ විකිණීමට තබාගන සිටීම හෝ විකුණන්ට ගෙනයෑම නීතියට විරුද්ධය.

11. කිරිවල යොදේ අහක්කර තිබෙනවායයි කිරි මිලේට ගන්නාවූ තැනැත්තාට පළමුකොට නොදන්වා කිසිවෙක් විසින් යොදේ අහක්කරනලද කිරි විකුණන්ට හෝ විකිණීම පිණිස දෙන්ට යුතුනැත.

12 සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැන හෝ පලාතේ දොස්තර මහත්මයා හෝ ඔහුගේ දෙවෙනියා හෝ නැතහොත් ලෝකල්බෝඩ් සභාවේ ඉන්ස්පැක්ටර් කෙනෙක් කිරි විකුණන්නාවූ හෙවත් විකිණීම පිණිස ගෙනියන්නාවූ මිනිහෙකු ළඟ තිබෙන කිරි හෝ ලියාපදිංචිකර තිබෙන පට්ටියක කිරි කොයිම වේලාවකදී නමුත් පරීක්ෂාකර බැලීම පිණිස ඉල්ලූවිට දෙන්නට ඕනෑය. එසේ නොදෙන්නාවූ යමෙක් වැරදිකාරයෙක් වෙනවා ඇත.

13. පරීක්ෂාකර බලන පිණිස ගත් කිරක් නරක්කර තිබෙන බව ඔප්පුවුනිනම් යම් පට්ටිකාරයෙකුගෙන් හෝ ඔහුගේ වැඩකාරයෙකුගෙන් ඒ පරීක්ෂාකිරීමට ගන්ට යෙදුනාද ඔහු වැරදිකාරයෙක් හැටියට කල්පනාකරනු ලැබේ.

14. මේ ඉහතකී අතුරුපණත් කඩකිරීම කරණකොටගෙන ලියාපදිංචිකර තිබෙන පට්ටියක් අවලංගුකිරීමට සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතැනට බලය තිබේ.

---

[රත්නපුරේ සනීපාරක්ෂක සභාව විසින් සාදනලද වැසිකිළි සම්බන්ධ අතුරුපණත්.]

1. ප්‍රථමකොට සභාපතිතැනගෙන් ලියවිල්ලක් පිට ලබනලද අවසරයක් නොමැතිව ඉඩම් හිමියෙකුට හෝ පදිංචිකාරයෙකුට ඔහුගේ ඉඩමේ හෝ ගේ අවට ප්‍රදේශයෙහි කිසිම විධියේ වැසිකිළියක් තැනීම හෝ තනවන්ට සැලැස්වීම නුසුදුසුවන.

2. (*a*) පළමුවෙනි උප නීතියේ ප්‍රකාර එවැනි අවසරයක් ලබාගැනීම පිණිස ඉල්ලුම්පත්‍රයක් යැවූ කල්හි සභාව විසින් පිළිගන්නාලද යම් විශේෂක්‍රමයේ වැසිකිළියක් මිස අන්‍ය ක්‍රමයේ වැසිකිළියක් නොතැනීමට බලකිරීමට සභාපතිතැනට හෝ සභාවට බලය තිබේ.

(b) තවද සභාපතිතැන හෝ සභාව එවැනි වැසිකිළියක් සෑදීමට සුදුසු ස්ථානයක් නියමකරනවා ඇත. තවද කිසිම වැසිකිළියක් අන්‍ය ස්ථානයක තැනීමට අවසරදීම ප්‍රතික්ෂෙපකරනවා ඇත.

(c) සනීපආරක්ෂක ක්‍රමයන් අනුව එවැනි ඉදිකිරීමකට අවසර නොදීම සෑහේයයි සභාපතිතැන හෝ සභාවට කල්පනා වන්නේනම් යම්කිසි ඉඩමක යම්කිසි වැසිකිළියක් තැනීමට අවසරයදීම සහමුලින්ම ප්‍රතික්ෂෙපකිරීමට සභාපතිතැනට හෝ සභාවට වැඩිදුරවත් බලය තිබේ.

(3) (a) අවසර නොමැතිව හෝ සභාපතිතැන විසින් හෝ සභාව විසින් නිකුත්කරණලද යම් අවසරපත්‍රයක ඇති වගන්තිවලට විරුඬව හෝ සාදනලද වැසිකිළියක් පිහිටා තිබෙන යම් ඉඩමක හිමිකාරයාට හෝ පදිංචිකාරයාට එම වැසිකිළිය සභාපතිතැන විසින් හෝ සභාව විසින් නියමකරණු ලබන සෑහෙන කාලයක් තුළදී බිදහෙලා වසාදැමීමට ලියවිල්ලකින් අණ කිරීමට සභාවට හෝ සභාපතිතැනට බලය තිබේ.

(b)—(a) යන උප වගන්තියේ ප්‍රකාර කරනලද අණක් ඉෂ්ටකිරීම කඩකරන්නාවූ යම් කෙනෙක් ඇද්ද ඔහු වරදක් කළාවේ.

4. (a) සභාවෙන් නියමකරන ආකාර එවැනි ක්‍රමයේ හෝ ප්‍රමාණයේ වැසිකිළියක් අසවල් ස්ථානයෙහි ඊට සම්බන්ධවූ කරුණුත් ඇතුව අඥවේ නියමකරන කාලයක් තුළදී ඉදිකිරීම පිණිස ඉඩම් හිමියාට හෝ පදිංචිකාරයාට සභාව විසින් අණකරනු ලැබේ.

(b)—(a) යන උප වගන්තියේ ප්‍රකාර කරනලද අණක් ඉෂ්ටකිරීම පැහැරඅරින්නාවූ යම් කෙනෙක් ඇද්ද ඔහු වරදක් කළාවේ.

5. (a) යම් වැසිකිළියක් පිහිටා තිබෙන්නාවූ ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට එම වැසිකිළිය සභාවෙන් නියමවන කාලයක් තුළදී සහ එම ප්‍රකාරයටත් අළුත්වැඩියාකිරීමට හෝ වෙනස්කිරීමට හෝ නැවත තැනීමටද නැතහොත් නියමකරණලද කාලයක් තුළදී බිදහෙළා වසාදැමීමට ලියවිල්ලකින් අණකරන්ට සභාවට පුළුවන. එසේ කරන්නේ සභාවේ කල්පනාවේ හැටියට එවැනි වැසිකිළියක් ඉදිකිරීම් ශාස්ත්‍රයේ හැටියට වරද සහිතනම් එක්කෝ එය පාවිච්චිකරන කාරණවට අයෝග්‍යනම් එක්කෝ එයින් අසනීපයක් හටගන්ට පුළුවන්නම්, එක්කෝ 8වෙනි උපනීතියේ ප්‍රකාර හෝ වෙන විධියකින් සභාව විසින් තනනලද සනීපආරක්ෂක අතුපාරක (මුඩුක්කු) නිසියාකාර පිහිටා නොමැත්තේද, එය පහසු ලෙස ශුඬකිරීමට නොහැක්කේද එම වැසිකිළිය පිහිටා තිබෙන්නාවූ ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට සභාවෙන් නියම වන්නාවූ ආකාරයට සහ නිසි කාලයක් තුළදී එම වැසිකිළිය අළුත්වැඩියාකිරීමට හෝ වෙනස්කිරීමට හෝ නැවත සෑදීමට හෝ කඩා වසාදැමීමට ලියවිල්ලකින් අණකිරීමට සභාවට පුළුවන.

(b)—(a) යන උප වගන්තියේ ප්‍රකාර කරණලද අණක් ඉෂ්ටකිරීම පැහැරඅරින්නාවූ යමෙක් ඇද්ද ඔහු වරදක්කළාවේ.

## වචනවල තේරුම්.

6. පහත දක්වන උප නීතිවල අදහස් පිණිස :—

"වැසිකිළිය" යන්නෙන් වියලි පස් දමන්ට බාල්දි තබා සාදන ක්‍රමයේ වැසිකිළි හැර අනිකුත් සියලුම ක්‍රමයේ වැසිකිළි හඟවනවත් හැර ඇතුළත්වේ.

"විශෙෂයෙන් නියමකරණලද භූමිභාගය" යන්නෙන් කලින්කලට සභාව විසින් විශෙෂයෙන් නියමකරණු ලබන්නාවූද සභාවේ සීමාව තුළ පිහිටියාවූද එවැනි භූමිප්‍රදෙශයක් හෝ ප්‍රදෙශ හඟවනවත් හැර ඇතුළත්වේ. එවැනි භූමිප්‍රදෙශය සීමා තුළ පිහිටි සියලුම භූමිය හෝ එයින් කොටසක් හෝ කොටස් ඇතුළත්වේ.

7. විශෙෂයෙන් නියමකරණලද භූමිභාගයක හෝ විශෙෂයෙන් නියමකරණලද භූමිභාගයක කොටසක පිහිටියාවූ ඕනෑම වර්ගයේ යම් විශෙෂ ක්‍රමයක වැසිකිළියක් පාවිච්චිකිරීම තහනම්කිරීමටද සියලුම වැසිකිළි බාල්දිතබා සාදන වියලිපස් දැමීමේ ක්‍රමය අනුව සෑදීමට නියමකිරීමටද සභා සම්මතය පිට පිළිවන්කම තිබේ.

8. වැසිකිළියක් හෝ වැසිකිළි පිහිටා තිබෙන ගෙයක හෝ ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට එම වැසිකිළිය හෝ වැසිකිළි වසාදමා ඒ වෙනුවට බාල්දි තබා සාදන වියලිපස් ක්‍රමයේ වැසිකිළියක් හෝ වැසිකිළි තැනීම පිණිස සභාව විසින් ස්ථිර කරණලද යෝජනාවක් පිට ලියවිල්ලකින් දැන්වීමක් කරනුලැබූ කල්හි එවැනි දැන්වීම භාර දීමේදී සභාව විසින් නියමකරණු ලබන කාලය තුළ එම දැන්වීමේ ප්‍රකාර ක්‍රියාකිරීම එම අයගේ හෝ අයවලුන්ගේ තද යුතුකමක්වේ. එවැනි දැන්වීමක තිබෙන කරුණු ඉෂ්ටකිරීම කඩකරන්නාවූ ඉඩම් හිමියා හෝ පදිංචිකාරයා අපරාධයක් කිරීමේ වරදකාරයෙක්වේ. තවද මේ නීතියේ ප්‍රකාර යම් වැසිකිළියක් තැනීම උවමනා කල්හි එය මොන වර්ගයේ එකක්ද එය පිහිටන ස්ථානය කෙසේද යනාදිය ගැන උවමනා කාරණ කියාදීම සභාපතිතැනට හැකිවනසේ 1 (පළමු) වෙනි නීතියේ ප්‍රකාර සභාපතිතැනගෙන් අවසර ගැණීම උවමනාවේ.

9. යම් වැසිකිළියක් පිහිටා තිබෙන ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා එම වැසිකිළිය යහපත් අන්දමේ සහ ශුඬ ලෙසටද සනීපාරක්ෂක පිළිවෙළටද තැබීම සහ එයින් අසනීපයක් හටනොගන්නා ලෙස බලාගැණීමත් ඔහුගේ යුතුකමක් වේ. එසේ කිරීම කඩකරන්නාවූ යම්කිසි ඉඩම් හිමියෙක් හෝ පදිංචිකාරයෙක් අපරාධයක්කිරීමේ වරදකාරයෙකු වන්නේය.

10. අසූචි ඉවත ගෙණ යාම යහපත්සේ කෙරෙණ පිණිස ඔවුන්ගේ ඉඩම් මැදින් හෝ පිටිපසින් අඩි 8කට වැඩි නොවන වැසිකිළි ශුඬකිරීමේ අතු පාරක් සභාපතිතැන කියන ආකාර ඔවුන්ගේම වියදමින් සෑදවීමට සහ එය පැවැත්වීමටත් විශෙෂයෙන් නියමකරණලද භූමිභාගයක පිහිටි ගෙවල් හෝ ගොඩනැගිලි හෝ ඉඩම් අයිතිකාරයාට හෝ එහි පදිංචිකාරයාට සභා සම්මතයෙන් කියා සිටීම නීති සහගතවේ.

11. යම්කිසි විශෙෂ භූමිභාගයක් ශුඬකිරීමේ කටයුතු සියල්ලම සභාව විසින් කරණුලැබේ. තවද සභාපතිතැනගෙන් අවසරයක් නොමැතිව යම් කෙනෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් සිටින කෙනෙකු විසින් හෝ ඔහුගේ මෙමෙහෙකරුවෙකු විසින් එවැනි වැඩකිරීම නීතියට විරුඬවේ. එම භූමිභාගය තුළ එවැනි වැඩ සියල්ලම සභාව මගින්ම හොඳකාර කරවීම හැකියයි සභාපතිතැනට කල්පනාවේ නම් එවැනි අවසරයක් දීම ප්‍රතික්ෂෙපකිරීමට සභාපතිතැනට බලය තිබේ.

12. අසූචි ඉවත්කිරීම පිණිස සභාව විසින් නියමකරනු ලබන්නාවූ ගාස්තු විශෙෂ භූමිභාගයක වැසිකිළි අයිතිකාරයන් හෝ පදිංචිකාරයන් විසින් මාස්පතා සභාවට ගෙවිය යුතුයි. එවැනි ගාස්තු එම මෙහෙය කළාවූ මාසයේ දහවෙනි දිනට ප්‍රථම යෙන් ගෙවිය යුතුයි.

13. දිනපතා කුලීකාරයින්ගේ මෙහෙය උවමනාකරණ ඇත්තන් විසින් ලියවිල්ලකින් සභාවෙන් ඉල්ලුම්කළ යුතුයි. තවද එම කුලීකාරයෝ සභාවෙන් ස්ථිරකරන ගෙවීමක් පිට සපයනු ලැබෙත්. එවැනි කුලීකාරයින්ගේ කුලිය වැඩකරන්ට යෙදෙන මාසේ දහවෙනිදාසින් ප්‍රථමයෙන් ගෙවිය යුතුයි.

14. විශෙෂ භූමිභාගයකින් පිටත වාසයකරන්නාවූ අයෙක් ඔහුගේ වැසිකිළිය ශුඬකිරීම සභාවට භාරදීමට හෝ දින පතා කුලීකාරයෙකුගෙන් වැඩගැනීමට කැමැත්තේනම් ඒ බව ලියවිල්ලකින් සභාපතිතැනට දැනුම්දිය යුතුයි. එවිට සභාව විසින් එම කෘත්‍යය භාරගන්නවා ඇත. එවැනි අයගෙන් ලැබියයුතු ගාස්තු වැඩකරන්ට යෙදුන මාසේ 10වෙනිදාට ඉස්සර ගෙවිය යුතුයි.

15. අලුත් කුණුවළක් සෑදීම හෝ පවතින්නාවූ කුණුවළක් වෙනස්කිරීම හෝ අලුත්වැඩියාකිරීම හෝ නැවතත් සෑදීම හෝ වසාදැමීම උවමනායයි සභාව කල්පනාකළ විටක අළුත් කුණුවළක් සෑදීමට වෙනස්කිරීමට හෝ අළුත්වැඩියාකිරීමට හෝ නැවතත් සෑදීමට හෝ පවතින්නාවූ කුණුවළක් වසාදැමීමට යම්කිසි ඉඩම් අයිතිකාරයෙකුට හෝ පදිංචිකාරයෙකුට සභාපතිතැන විසින් අත්සන්කරනලද ලියවිල්ලකින් දැන්වීමක් කිරීමට සභාවට හැකිය. තවද එවැනි කුණුවළක් පිහිටන ස්ථානයද එම මට්ටම සහ ප්‍රමාණයද එය සෑදීමට ගතයුතු උපකරණද, වැඩේ කළයුතු අන්දම සහ එවැනි වැඩ සම්බන්ධවූ අනිකුත් විස්තර කාරණද ගැන කරුණු දන්වනවා ඇත. එවැනි දැන්වීමක් ලැබුනාට පසු සභාවෙන් නියමිත කාලය තුළදී සභාව විසින් උවමනාකරකලද කාරණ ඉෂ්ටකිරීම පැහැරඅරින්නාවූ යම් ඉඩම් හිමියෙක් හෝ පදිංචිකාරයෙක් අපරාධයක්කිරීමේ වරදකාරයෙකු වෙනවා ඇත.

16. කුණුවතුර ගලාගොස් එක්කාසුවෙන වළක් ඇති යම් ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට එවැනි වතුර දිනපතා ඉවත්කිරීම සභාව විසින් කරණුලබන බව සභාපතිතැන විසින් දැනුම්දීම නීතිඥයකවේ. එම කුණුවතුර ඉවත්කිරීම පිණිස සභාව විසින් නියමකරනු ලබන යොග්‍යවූ ගාස්තු ගෙවීමට ඉඩම් හිමියා හෝ පදිංචිකාරයා බැඳිසිටියි. එවැනි ගාස්තු එම මෙහෙය කළාවූ මාසයේ දහවෙනි දිනට මත්තෙන් ගෙවිය යුතුයි.

17. කුණුවතුර ගලාගොස් එක්වන්නාවූ යම් වළක් පිහිටි ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා 16වෙනි නීතියේ ප්‍රකාර සභාපතිතැන විසින් දැනුම්දෙනු නොලැබුවේනම් එම ජලයෙන් බාධාවක් හටනොගන්න හැටියට සභාපතිතැන විසින් නියමකරනු ලබන ස්ථානයකට එම ජලය ඉවත්කිරීම ගැන වගකිය යුතුයි. යම් ඉඩම් හිමියෙක් හෝ පදිංචිකාරයෙක් ඉහතකී ප්‍රකාර එවැනි කුණුවතුර ඉවත්කිරීම කඩකළොත් ඔහු අපරාධයක්කිරීමේ වරදකාරයෙකු වන්නේය.

## ඉඩම් විකිණීම.

වෂී 1917ක්වූ ඔක්තෝම්බර් මස 12වෙනි දින ප්‍රසිඞවූ නෝම්බර 6,902 දරණ ගැසට් පත්‍රයේ පෙනීයන නෝම්බර 3,081කේ ඉඩම් නොතිසියේ පෙනීයන නෝම්බර 10,565 ප්ලෑනේ සඳහන් නෝම්බර 2 සහ 3 දරණ බිම්කට්ටි වෂී 1917ක්වූ දෙසැම්බර් මස 11වෙනි දිනට නියමකර තිබෙන විකිනීමෙන් අස්කළ බව සියලුදෙනාටම මෙයින් දන්වමි.

වෂී 1917ක්වූ දෙසැම්බර් මස 5වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටිවන්ස්,
ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

---

**No. 2,130, N.W. P.**—වයඹ දිසාවේ පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කේ උපඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වෂී 1918ක්වූ ජනවාරි මස 15වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට මාරවිල තානායමේදී බේරුම්කරදෙන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ හලාවත දිස්ත්‍රික්කුවේ දකුණු පිටිගල්කෝරලේ පිහිටාතිබෙන බිම්කැබලි 11ක්.

සිතියම 4,791/289. ගම—ගෝනාවිල. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මිල්ලගහවත්ත | .. ඉනෙසෙන්ති ප්‍රේරා සහ තවත් කෙනෙක් | .. පොල් වත්ත | .. 2 1 5 |
| 2 | එම | .. එම .. .. | .. එම | .. 0 2 0 |
| | | සිතියම 281. ගම—පලුවැල්ගාල. | | |
| 2425*a* | කළුම්බේවත්ත | .. ජේ. පී. පන්ඩිතසේකරගේ උරුමක්කාරයෝ විසින් අල්ලා බුත්ති විඳි .. .. | .. එම | .. 0 0 29 |
| 2425*b* | කොටුකොලපිටිය | .. කේ. ඇම්. සී. ප්‍රනාන්දු විසින් අල්ලා බුත්තිවිඳි | .. කුඹුර | .. 0 0 10 |
| | | සිතියම 4,787. ගම—පලුවැල්ගාල. | | |
| 1 | කහටගහවත්ත | .. ඒ. කොර්නිසා අල්ලාගන තිබේ .. | .. පොල් වත්ත | .. 0 0 19 |
| 5 | කුරුකැප්පිටියාවවතත | .. අන්නම්ලේ සෙට්ටි අල්ලාගන තිබේ .. | .. එළිකළ ඉඩම | .. 0 1 1 |
| | | සිතියම 4,785. ගම—මානින්ගල. | | |
| 4 | කොස්ගහවත්ත | .. එච්. පී. උන්ගුහාමි අල්ලාගන තිබේ .. | .. පොල් වත්ත | .. 0 2 0 |
| 5 | එම | .. කේ. එච්. පීරිස් අල්ලාගන තිබේ .. | .. එම | .. 0 0 13 |
| | | සිතියම 4,123. ගම—මානින්ගල. | | |
| I 54 | කොන්ගහවත්ත | .. ක්‍රිස්තිනාහාමි සහ බාරෙන්ච් අප්පුහාමි .. | .. එම | .. 0 2 25 |
| N 54 | මකුලුගහවත්තේහේන | එම .. .. | .. එම | .. 1 0 31 |
| U 54 | කෝන්ගහවත්තේහේන | ක්‍රිස්තිනාහාමි .. .. | .. එම | .. 1 1 9 |

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර කාරනා පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කුවේ උපඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ පැලෑන කඩදාසි සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වෂී 1917ක්වූ නොවැම්බර් මස 29වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,458, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වෂී 1918ක්වූ ජනවාරි මස 18වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට අලව්වේදී බේරුම් කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනි හත්පත්තුවේ දකුණු උඩුකහකෝරලේ කොඩාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 469. ගම—ගල්වරම.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 10*d* | කටුහේන | .. ගල්වරම පදිංචි අප්පුහාමි ආච්චිලගේ උක්කුඑතනා | .. හේන | .. 3 1 8 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වෂී 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,459, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වෂී 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට බිංගිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙනා අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කිනියමකෝරලේ කොඩාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 16ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 1,452. ගම—බෝවත්ත.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1½*f* | කොහොඹදළුවේහේන | .. (1) බෝවත්තේ පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ මුදලිහාමි, (2) එම සිලිඳු එතනා, (3) එම කරානිස්අප්පු, (4) මරක්කල මුල්ලේ පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ ගුනරත්හාමි | .. හේන | .. 0 0 23 |
| 1½*g* | එම | .. එම .. .. | .. එම | .. 0 1 15 |
| 1½*j* | කොහොඹදළුවේහේනදෙනිය | බෝවත්තේ පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ බන්ඩිරාල | .. හේන සහ දෙනිය | .. 0 1 20 |
| 1½*k* | එම | .. එම .. .. | .. එම | .. 1 1 29 |

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | අන්දම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1½m | මසිලගහහේනදෙනිය | (1) පනාවැවේ පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ අප්පුහාමි, (2) කෝරලගේ කිරිමැනික් එතනා, (3) එම පොඩිසිඤ්ඤෝ, (4) එම හේතුහාමි, (5) එම මැනික්එතනා, (6) එම රන්මැනික් එතනා, (7) අදිකාරිමුදියන්සෙලාගේ අප්පුරල | හේන සහ දෙනිය | 0 | 3 | 28 |
| 1½n | මසිලගහකුඹුර | එම | කුඹුර | 1 | 0 | 17 |
| 4ae | කෝන්වැටියවෙලපිල්ලෑව | (1) බෝවත්තේ පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ කිරිබන්ඩප්පුහාමි ආරච්චි, (2) එම අප්පුහාමි | හේන | 0 | 0 | 39 |
| 4ag | එම | (1) එම ගම පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ උක්කුබන්ඩා, (2) එම පිංහාමි, (3) එම රන්හාමි | එම | 0 | 1 | 23 |
| 4ai | ඈහැටුගහමුලහේන | (1) අදිකාරිමුදියන්සෙලාගේ මුදලිහාමි, (2) එම කරානිස්අප්පු | එම | 1 | 2 | 39 |
| 4aj | පාළුවත්තේහේන නොහොත් කදුරුගහමුලහේන | බෝවත්තේ පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ බන්ඩිරාල | එම | 1 | 0 | 6 |
| 13y3 | බක්මීගහමුලවත්ත | එම ගම පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ හිටිහාමි | වත්ත | 2 | 2 | 15 |
| 13a | මැදහේන | (1) එම ගම පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ පුංචිරාල, (2) එම වන්නිහාමි | හේන | 1 | 1 | 11 |
| 13a1 | එම | එම | එම | 0 | 1 | 2 |
| 30 | තල්ගහහේන | (1) එම ගම පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ බන්ඩිරාල, (2) එම පුංචිරාල | එම | 4 | 2 | 11 |
| 30c | කදුරුගහහේන | (1) එම ගම පදිංචි එම ජෝතිහාමි, (2) එම උක්කුමැනිකා | එම | 3 | 1 | 22 |
| 13m1 | දන්ගහමුලහේන | බෝවත්තේ පදිංචි අදිකාරිමුදියන්සෙලාගේ පුංචිමැනිකා | එම | 0 | 2 | 14 |

—අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වෙයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,460, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට කින්ගිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පල හත්පත්තුවේ කිනියමකෝරලේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 19ක්.

ලංකාමැනීමේ සිතියම 1,463. ගම—නිතලාව.

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | අන්දම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 55 | තිසවරාලාගෙ පිල්ලෑව | නිතලාවේ පදිංචි වීරකෝන්මුදියංසෙලාගේ බෙලෝසිංඤෝ | හේන | 1 | 1 | 26 |
| 56 | වෙලපිල්ලෑව | එම | එම | 1 | 3 | 14 |
| 52cd | වැටියවෙලපිල්ලෑව | නිතලාවේ පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ කිරිබන්ඩා | එම | 3 | 2 | 32 |
| 52ch | පළුගහවැටියපිල්ලෑව | (1) එමගම පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ කිරිබන්ඩා, (2) එම මුදලිහාමි, (3) එම ජුවානිස්අප්පු, (4) එම රන්මැනිකා, (5) හෙට්ටිතම මුදියන්සෙලාගේ රන්මැනිකා | එම | 1 | 2 | 20 |
| 52ds | එම | එම | එම | 1 | 2 | 33 |
| 52cc | පුංචිවැටියහේන | (1) එමගම පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ මැනුඑතනා, (2) එම පුංචිමැනිකා, (3) එම බැලෝසිඤ්ඤෝ | එම | 6 | 0 | 37 |
| 52cp | කෝන්ගහමුලහේන | එමගම පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ කිරිබන්ඩා | එම | 5 | 3 | 17 |
| 52co | මිරිස්හේන | (1) එමගම පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ බන්ඩිරාල, (2) එම රන්හාමි | එම | 6 | 2 | 2 |
| 52dm | එම | එම | එම | 0 | 0 | 14 |
| 52dn | කෝන්ගහමුලහේන | (1) එමගම පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ පුංචිරාල, (2) එම මුදලිහාමි, (3) එම ජුවානිස් අප්පු, (4) එම රන්මැනිකා | එම | 1 | 3 | 16 |
| 52ar | සියඹලාගහමුලහේන | (1) එමගම පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ අන්ඩිහාමි, (2) එම පුංචිහාමි | එම | 0 | 1 | 31 |
| 52as | එම | එම | එම | 0 | 3 | 34 |
| 52cq | එම | හල්මිල්ලවැවේ පදිංචි රත්නායකමුදියන්සෙලාගේ හේරත්හාමි | එම | 0 | 3 | 15 |
| 52cr | එම | එම | එම | 0 | 3 | 18 |
| 2v | වත්තගාවහේන | (1) නිතලාවේ පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ දුවිත්අප්පුගේ උක්කුරාල, (2) වීරකෝන්මුදියන්සෙලාගේ සිලප්පුගේ බන්ඩිරාල | එම | 1 | 3 | 11 |
| 2t | කොහොඹගහමුලපිල්ලෑව | එමගම පදිංචි වීරකෝන් මුදියන්සෙලාගේ හිටිහාමි | එම | 0 | 3 | 0 |
| 2u | එම | එම | එම | 0 | 1 | 33 |
| 2ab | ගොඩකුඹුරහේන | එමගම පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ දුවිත් අප්පුගේ උක්කුරාල | එම | 4 | 0 | 39 |
| 33 | එම | එම | එම | 2 | 1 | 4 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,461, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට කිංගිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පල හත්පත්තුවේ කිනියම කෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 22ක්.

ලංකාමැනීමේ සිතියම 1,459. ගම—කුඹුකොළුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | අන්දම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2 | තලගහමුලහේන | කුඹුකොළුවවිහාරේ භාරකාර රත්නායකමුදියන්සෙලාගේ අප්පුහාමිවිදානේ | හේන | 4 | 3 | 38 |
| 38d | හල්අඹගහමුලහේන | එම ගම පදිංචි රාජපක්ෂ මුදියන්සෙලාගේ පුංචිරාල | එම | 4 | 2 | 31 |

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්න. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 38*i* | වැගල්ලගාවහේන | හබවැවේ පදිංචි හත්ගෙඩිගුරුන්නැහෙලගේ සිංඤෝනයිදේ | හේන | 3 | 0 | 19 |
| 42*ai* | පතහගාවහේන | එම | එම | 0 | 2 | 33 |
| 49 | පතහගාබකොටුව | එම | එම | 0 | 2 | 0 |
| 38*k* | තලගහමුලහේන | කුඹුකොළවේ පදිං රජපක්ෂමුදියන්සෙලගේ පුංචිහාමි | එම | 3 | 2 | 32 |
| 42*aj* | කහටගහමුලහේන | (1) හබවැවේ පදිංචි හත්ගෙඩි ගුරුන්නැහෙලගේ උන්ගු නයිදේ, (2) එම පිනා නයිදේ | එම | 3 | 3 | 26 |
| 42*ak* | එම | එම | එම | 1 | 1 | 9 |
| 25*z* | නිකහේන | කුඹුකොළවේ පදිංචි ලේකමලගේ මැනුවිතන | එම | 1 | 2 | 10 |
| 42*am* | අඹගහමුලහේන | එම ගම පදිංචි රජපක්ෂමුදියන්සෙලගේ පුංචිරාල | එම | 2 | 3 | 36 |
| 42*an* | අඹගහමුලවත්ත | එම | වත්ත | 0 | 0 | 4 |
| 42*ao* | වත්තහේන | එම | හේන | 1 | 0 | 9 |
| 38*f* | රනමර ගොල්ලේ හේන කොටුව | හබවැවේ පදිංචි අමාරිස්ගුරුන්නැහෙලගේ ලමානයිදෙ | දුම්වත්ත | 0 | 1 | 26 |
| 38*g* | කිවිලගාවපිල්ලුව | එම | හේන | 1 | 2 | 2 |
| 25*ag* | කෝන්ගහමුලහේන | (1) කුඹුකොළවේ පදිංචි රජපක්ෂමුදියන්සෙලගේ සිලිදුහාමි, (2) එම මුදලිහාමි, (3) එම පුංචිරාල | එම | 1 | 0 | 39 |
| 25*as* | එම | එම | දුම්වත්ත | 0 | 3 | 34 |
| 25 | වැවපාවුලපිම්ග | (1) රජපක්ෂමුදියන්සෙලගේ මැනුහාමි, (2) එම කිරිබන්ඩ, (3) රජපක්ෂමුදියන්සෙලගේ කිරිහාමි | හේන | 0 | 3 | 6 |
| 25*ag* | දික්හේන | (1) කුඹුකොළවේ පදිංචි රජපක්ෂ මුදියන්සෙලගේ මුදලිහාමි, (2) මච්නාවේ පදිංචි රජපක්ෂමුදියන්සෙලගේ හිඟිරිමැනික්එතන | එම | 6 | 3 | 27 |
| 25*ae* | කහටගහමුලහේන | (1) කුඹුකොළවේ පදිංචි රජපක්ෂමුදියන්සෙලගේ මුදලිහාමි, (2) එම අන්ඩිහාමි, (3) එම රත්මැනික | එම | 2 | 2 | 35 |
| 25*ao* | කත්දේහේන | (1) එම ගම පදිංචි රජපක්ෂමුදියන්සෙලාගේ මැනුහාමි, (2) එම සිලිදුහාමි | එම | 2 | 3 | 28 |
| 42*al* | කිවිලගාවහේන | එම ගම පදිංචි රජපක්ෂ මුදියන්සෙලගේ පුංචිරාල | එම | 2 | 2 | 24 |
| 42*k* | ඇහැටුගහමුලහේන | (1) හබවැව පදිංචි අමාරිස් පටබැදිගුරුන්නැහෙලාගේ සිරිමල් නයිදෙ, (2) එම කව්වා නයිදෙ | එම | 1 | 3 | 26 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,462, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විනිශ්චය නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට බින්ගිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කිනියම්කෝරලේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 14ක්.

ලංකාමැනීමේ සිතියම 1,453. ගම—මච්නාව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 16*a* | කොස්ගහවත්ත | (1) මච්නාවේ පදිංචි කෝරලලාගේ අප්පු සිංඤෝ, (2) එම හිංගිරි බන්ඩ | ලඳුකැලය | 0 | 1 | 9 |
| 17 | එම | එම | එම | 2 | 1 | 1 |
| 19 | එම | එම | වත්ත | 1 | 2 | 7 |
| 32 | තල්ගහමුලවත්ත | (1) එම ගම පදිංචි කෝරලේ ආරච්චිලගේ අප්පුහාමි, (2) එම මැනික්හාමි, (3) එම කිරිමැනිකා, (4) එම රෙමෙල් එතනා, (5) එම මැනුඑතනා | එම | 1 | 1 | 38 |
| 33*d* | තල්ගහමුලහේන | එම | එම | 1 | 1 | 25 |
| 33*e* | එම | එම | හේන | 0 | 0 | 22 |
| 33*g* | තිඹිරිගහවත්ත | එම | එම | 0 | 2 | 13 |
| 36½ | එම | එම | වත්ත | 0 | 1 | 0 |
| 33*i* | කදුරුගහමුලහේන | (1) එම ගම පදිංචි කෝරලේ ආරච්චිලගේ පින්හාමි, (2) එම අප්පුහාමි | හේන | 2 | 2 | 12 |
| 35*c* | පන්සල්වත්ත | මච්නාවේ පන්සල භාරකාර අතුකෝරලගේ සිට්ටප්පුහාමි | එම | 2 | 2 | 21 |
| 50 | කෝන්ගහවත්ත | එම | වත්ත | 0 | 2 | 8 |
| 43*f* | කදුරුගහවත්ත | එම ගම පදිංචි කෝරලේ ආරච්චිගේ පුංචිරාල | හේන | 4 | 2 | 18 |
| 63*h* | හැලඹගහහේන | (1) එම ගම පදිංචි තෙන්හාමි ආරච්චිලගේ සිට්ටප්පු, (2) මච්නාව පන්සල භාරකාර අතුකෝරලගේ සිට්ටප්පුහාමි | එම | 1 | 0 | 34 |
| 64 | වැවගාවකොරටුව | එම | එම | 0 | 0 | 34 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 වනතුරුය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද දැනගත හැකිවේ.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ
මහලේකම් තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 4,463, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විනිශ්චය නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට බින්ගිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කිනියම්කෝරලේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 11ක්.

ලංකාමැනීමේ සිතියම 1,451. ගම—පනාවැව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ළුම්කාරයා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1*j* | කහටගහමුලහේන | (1) පනාවැව පදිංචි කෝන්වැව බ්‍රාහ්මයාලාගේ පොඩ්ඩී, (2) එම සව්වති, (3) එම තම්බිලා, (4) එම බඩී | හේන | 0 | 1 | 0 |
| 2*l* | කහටගහහේන | එම | එම | 1 | 1 | 11 |
| 2*m* | කෝන්ගහමුලහේන | පනාවැවේ පදිංචි සොමිදු බ්‍රාහ්මයාලාගේ පුන්චා | එම | 1 | 2 | 39 |
| 2*n* | කෝන්ගහවත්ත | එමගම පදිංචි යක්දෙස්සාලාගේ ගින්තා | වත්ත | 0 | 1 | 28 |
| 4*v* | එම | එම | එම | 0 | 2 | 6 |
| 4*s* | කහටගහමුලවත්ත | එමගම පදිංචි සොමිදු බ්‍රාහ්මයාලාගේ කිරිපුන්චා | එම | 0 | 0 | 37 |
| 4*t* | අඹගහමුලවත්ත | එමගම පදිංචි පනම්බෙරගේ රෙමෙල් පොන්සේකා | එම | 0 | 1 | 17 |
| 4*u* | අඹගහමුලහේන්යාය | එම | හේන | 0 | 2 | 6 |

ලංකාමැනීමේ සිතියම 1,447. ගම—තල්ගහපිටිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ළුම්කාරයා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2*l*5 | සියඹලාගහවත්ත | තල්ගහපිටියේ පදිංචි මයිපාලමුදලීගේ සෙල්නයා පීරිස් | කෙසෙල් වතත | 0 | 0 | 6 |
| 7 | එම | එම | වත්ත | 1 | 2 | 35 |
| 2*l*1 | දන්ගහවත්ත | (1) එමගම පදිංචි අලහකෝන් ආරච්චිගේ රොමානිස්අප්පු, (2) හෙට්ටිආරච්චිගේ අන්තෝනි අප්පුහාමි | එම සහ හේන | 1 | 1 | 37 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

**No. 4,464, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට බිංගිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුනෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කිනියමකෝරළේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 10ක්.

ලංකාමැනීමේ සිතියම 1,449. ගම—මුරුකන්ඩිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 5a | සියඹලාගහවත්ත .. | මුරුකන්ඩියේ පදිංචි හේරත්මුදියන්සෙලාගේ පිංහාමි .. | වත්ත .. | 0 | 1 | 2 |
| 16c | එම .. | එම .. .. .. | එම .. | 0 | 0 | 13 |
| 23 | පැලවත්ත .. | එම ගම පදිංචි ශ්‍රීබ්‍රාහ්මණආරච්චිමුදියන්සෙලාගේ කිරිබන්ඩා රිජිස්ත්‍රාර් | එමසහහේන | 5 | 0 | 29 |
| 23a | ඇහැටුගහවත්ත .. | බාලසූරියමුදියන්සෙලාගේ මැනුඑතනා .. .. | වත්ත .. | 0 | 2 | 12 |
| 36 | ඇහැටුගහවතත නොහොත් පැලවත්ත | එම .. .. .. | එම .. | 8 | 1 | 15 |

ලංකාමැනීමේ සිතියම 1,462. ගම—ගණේගොඩ.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 4c | මණ්ඩුක්කාහේන | ගණේගොඩ පදිංචි අතුකෝරලගේ අප්පුහාමි .. .. | හේන .. | 11 | 0 | 31 |
| 52f | මීගහහේන .. | (1) එම ගම පදිංචි උක්කුවාහේනයාලාගේ කිරහේනයා, (2) එම රනාහේනයා .. .. .. | එම .. | 1 | 2 | 15 |
| 1o | වත්තගාවහේන .. | එම ගම පදිංචි ඉමියහාමිමුදියන්සෙලාගේ අප්පුහාමි .. | එම .. | 5 | 1 | 9 |
| 1d | ඉදිපිටියහේන . | (1) එම ගම පදින්චි ඉමියහාමිමුදියන්සෙලාගේ අප්පුහාමි, (2) එම බබාඑතනා .. .. .. | එම .. | 4 | 1 | 18 |
| 1m | සියඹලාගහමුලහේන | (1) එම ගම පදිංචි හේරත්මුදියන්සෙලාගේ අප්පුගාමි, (2) ඉමියහාමි මුදියන්සෙලාගේ මල්හාමි .. .. .. | එම .. | 4 | 0 | 19 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්‍ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වෙනුවට.

---

**No. 4,465, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට බිංගිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුනෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කිනියමකෝරළේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ සිතියම 1,454. ගම—දළුපොත.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 30e | සියඹලාගහමුලවතත | (1) දළුපොත පදිංචි රාජපක්‍ෂ මුදියන්සෙලාගේ සිව්ටප්පුහාමි, (2) එම බන්ඩා .. .. .. | වත්ත .. | 1 | 1 | 18 |
| 30p | එම .. | (1) එම ගම පදිංචි එම කිරිහාමි, (2) එම රන්මැනිකා, (3) එම කිරි බන්ඩා, (4) එම සිව්ටප්පුහාමි .. .. .. | වත්ත සහ හේන.. | 4 | 1 | 38 |

ලංකාමැනීමේ සිතියම 1,461. ගම—හල්මිල්ලවැව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1h | වත්තගාවහේන .. | (1) මැදගම පදිංචි රන්දුනුපතිරන්නැහෙලාගේ සිඤ්ඤප්පුහාමි, (2) රත්නායකමුදියන්සෙලාගේ මැනුඑතනා, (3) එම අප්පුහාමි විදානේ, (4) එම යහපත්හාමි, (5) එම හිටිහාමි .. .. | ලඳුකැලය | 4 | 1 | 12 |
| 1g | එම .. | (1) රත්නායකමුදියන්සෙලාගේ පුංචිරාල, (2) එම මුදලිහාමි, (3) හල්මිල්ලවැවේ පන්සල භාරකාර එම හේතුරාල .. .. | එම .. | 5 | 0 | 10 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්‍ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වෙනුවට.

---

**No. 4,466, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට බිංගිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කිනියමකෝරළේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබෙලි 8ක්.

ලංකාමැනීමේ සිතියම 1,455. ගම—හෙන්දියාගම.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 12f | බංගලාවගාවහේන .. | නිතලාවේ පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ උක්කුබන්ඩා විදානේ | හේන | .. 0 | 2 | 11 |
| 12j | මාරගහමුලහේන .. | කඩිගමුවේ පදිංචි වනිගසූරිය පතිරන්නැහෙලාගේ කිරිඑතනා .. | එම | .. 2 | 2 | 2 |
| 12k | එම .. | එම .. .. .. | එම | .. 1 | 1 | 15 |
| 2e | පහලකුඹුරපිල්ලෑව .. | (1) එමගම පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ අප්පුහාමි කෝරාල, (2) එම උක්කුබන්ඩා විදානේ, (3) එම අප්පුසිඤ්ඤෝ .. | එම | .. 1 | 2 | 24 |
| 5j | දම්නගහහේන .. | දළුපොත පදිංචි රාජපක්‍ෂමුදියන්සෙලාගේආරච්චිලගේසන්තුඑතනා | එම | .. 4 | 1 | 38 |
| 2m | වැවපාවුලකුඹුරපිල්ලෑව.. | (1) නිතලාව පදිංචි වීරකෝන්මුදියන්සෙලාගේ අප්පුහාමි කෝරාල, (2) එම උක්කුබන්ඩා විදානේ, (3) දළුපොත පදිංචි රාජපක්‍ෂමුදියන්සෙලාගේ ආරච්චිලගේ උක්කුබන්ඩා, (4) රාජපක්‍ෂමුදියන්සෙලාගේ ආරච්චිලගේ සන්තුඑතනා .. .. | එම | .. 0 | 2 | 30 |
| 2g | හල්මිල්ලගහකුඹුරපිල්ලෑව | (1) වික්‍රමමුදියන්සෙලාගේ අප්පුහාමි කෝරාල, (2) එම උක්කුබංඩා විදානේ, (3) රාජපක්‍ෂමුදියන්සෙලාගේ ආරච්චිලගේ උක්කුබන්ඩා, (4) එම සන්තුඑතනා .. .. .. | එම | .. 0 | 2 | 2 |

ලංකාමැනීමේ සිතියම 1,439. ගම—බ්‍රාහ්මනයාගම.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 19 | කෝන්ගහකොටුව .. | ඉහලගල්වැවේ පදිංචි හේරත්මුදියන්සෙලාගේ දුවිත් අප්පුහාමි .. | වත්ත | .. 1 | 3 | 35 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිවේ.

වර්‍ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ
මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම් වෙනුවට.

**No. 4,467, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 26වෙනි දිනවූ සෙනසුරාදා පස්වරු 2ට කුලියාපිටියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුනෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කටුගම්පලකෝරලේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 16ක්.

ලංකාමැනීමේ ඇඩ්වාන්ස් ඇක්ස්ට්‍රැක්ට් මුල් සිතියම 996. ගම—උඩුබද්දාව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 7 | මැදඅගාරේවත්ත | පී. චාල්ලිස් පීරිස් | වත්ත | 106 1 38 |
| 9 | ඉස්ටැව්යවත්ත | බන්ඩා කෝරල | එම | 0 0 31 |
| 10 | එම | ජේ. විකිරල | වත්ත සහ හේන | 2 3 24 |
| 11 | මාදන්ගහවත්ත | බන්ඩා කෝරල | වත්ත | 6 3 26 |
| 12 | මැදඅගාරේවත්ත | පී. චාර්ලිස් පීරිස් | එම | 15 1 5 |
| 13 | මහඇලවත්ත | එලාරිස් පීරිස් අප්පුහාමි | එම | 53 0 4 |
| 14 | එම | එම | එම | 1 0 6 |
| 15 | තිප්පොලඅගාරේවත්ත | එම | එම | 7 1 23 |
| 16 | එම | එම | එම | 15 2 6 |
| 18 | එම | එම | එම | 1 2 11 |

ලංකාමැනීමේ ඇඩ්වාන්ස් ඇක්ස්ට්‍රැක්ට් මුල් සිතියමේ නොම්මර 1,000.—අමනමුල්ල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඉහලඅගාරේවත්ත | එලාරිස් පීරිස් අප්පුහාමි | වත්ත | 53 3 13 |
| 2 | තිප්පොලඅගාරේවත්ත | එම | එම | 5 2 9 |
| 3 | එම | එම | එම | 4 3 25 |

ලංකාමැනීමේ ඇඩ්වාන්ස් ඇක්ස්ට්‍රැක්ට් මුල් සිතියමේ නොම්මරය 1,001.—කුනුතිප්පොල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තිප්පොලඅගාරේවත්ත | එලාරිස් පීරිස් සහ ආරොන් ප්‍රනාදු | හේන | 28 2 8 |
| 3 | එම | එලාරිස් පීරිස් | වත්ත | 11 0 28 |
| 4 | තිප්පොලඅගාරේකුඹුර | එම | කුඹුර | 3 2 3 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්‍ගහ.

---

**No. 4,468, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 26වෙනි දිනවූ සෙනසුරාදා පස්වරු 2ට කුලියාපිටියේදී චංචල නිශ්චල ඔප්පුව දීමට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුනෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කටුගම්පලකෝරලේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ ඇඩ්වාන්ස් ඇක්ස්ට්‍රැක්ට් මුල් සිතියම 996. ගම—උඩුබද්දාව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 8 | මැදඅගාරේවත්ත | පී. චාර්ලිස් පීරිස් | වත්ත | 3 1 3 |
| 17 | තිප්පොලඅගාරේ සහ අමනමුල්ල ඇස්වේට් | එලාරිස් පීරිස් සහ උඩබේසේකර නෝනා මහත්මයා | එම | 1 0 29 |

ලංකාමැනීමේ ඇඩ්වාන්ස් ඇක්ස්ට්‍රැක්ට් මුල් සිතියමේ නොම්මරය 1,000.—අමනමුල්ල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | අමනමුල්ල ඇස්ටේට් | උඩබේසේකර නෝනාමහත්මයා | වත්ත | 0 2 2 |

ලංකාමැනීමේ ඇඩ්වාන්ස් ඇක්ස්ට්‍රැක්ට් මුල් සිතියමේ නොම්මරය 1,001.—කුනුතිප්පොල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | තිප්පොලඅගාරේවත්ත | එලාරිස් පීරිස් | වත්ත | 7 3 12 |

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්‍ගහ.

---

**No. 4,469, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙනි ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට බිංගිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුනෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ යාගම්පත්තු කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 5ක්.

සිතියම 4,476. ගම—වතුවත්ත.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| R 107 | සියඹලාගස්රුප්පේ ඇස්ටේට් | (1) කොළඹ වැල්ලවීදියේ පදිංචි මූනා. රූනා. පානා. ලානා. පෙරියානන් චෙට්ටි, (2) මූනා. රූනා. පානා. ලානා. මුරුගප්පන් චෙට්ටි, (3) වානා. පානා. ලානා. වාවන්නා. අනමලී චෙට්ටි, (4) වානා. පානා. ලානා. වාවන්නා, සමිනාදන් චෙට්ටි, (5) කොළඹ බංගසාල වීදියේ පදිංචි ආනා. මූනා. මූනා. ශේගු මොහම්මදු සම්සුදීන්, (6) ආනා. මූනා. මූනා. ශේගු මොහම්මදු, (7) ආනා. මූනා. මූනා. ජුමාසිල්, (8) ආනා. මූනා. මූනා. මොහම්මදු මොහිදීන් | වත්ත | 41 0 30 |
| R 107½ | එම | එම | එම | 24 3 35 |
| Q 107 | එම | එම | එම | 56 0 7 |
| Q 107½ | එම | එම | එම | 22 3 28 |

සිතියම 4,476. ගම—සියඹලාගස්රුප්පේ.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| Z 107 | එම | එම | කැලය සහිත වත්ත | 28 0 6 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්‍ගහ.

**No. 4,470, S. O.**—ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිණීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට සිංහිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කිනියමකෝරලේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ සිතියම 1,420. ගම—පහල ගල්වැව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා හෝ ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 6*g* | දිවුල්ගහහේන .. | ආණ්ඩුව .. .. .. .. | හේන .. | 1 | 1 | 15 |
| 19 | කොහොඹගහවත්ත .. | රජකදළුවේ පදිංචි රත්නායකමුදියන්සෙලාගේ දෙන් ජුවන් අප්පුහාමි | වත්ත .. | 1 | 2 | 36 |
| 20 | කජුගහහේන .. | එම .. .. .. .. | හේන .. | 1 | 0 | 13 |
| 19*c* | කොහොඹගහවත්ත .. | කොස්හේනගම අගාරේ පදිංචි රත්නායකමුදියන්සෙලාගේ බන්ඩප්පු | වත්ත .. | 1 | 2 | 4 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 5වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වෙනුව.

---

**No. 4,471, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිණීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට සිංහිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කිනියම කෝරලේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 13ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 1,419. ගම—ඉහලගල්වැව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා, | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1*a* | විලදගහමුලහේන .. | ආණ්ඩුව .. .. .. .. | හේන | 1 | 1 | 14 |
| 12*b*2 | දන්ගහහේන .. | එම .. .. .. .. | එම | 5 | 2 | 27 |
| 12*l* | දම්නගහපිල්ලෑව .. | එම .. .. .. .. | එම | 0 | 2 | 8 |
| 12*j* | ගලගාවහේන .. | එම .. .. .. .. | එම | 2 | 2 | 32 |
| 12 | එම .. | එම .. .. .. .. | එම | 4 | 1 | 34 |
| 13 | කෝන්ගහවත්ත .. | හලාවතකුඹුරිප්පුවේ පදිංචි හේරත්මුදියන්සෙලගේ අප්පුහාමි .. | වත්ත | 0 | 2 | 25 |
| 11 | එම .. | රජකඩළුවේ පදිංචි රත්නායකමුදියන්සෙලගේ දෙන් ජුවන් අප්පුහාමි .. | එම | 1 | 2 | 15 |
| 14 | එම .. | (1) ඉහලගල්වැවේ පදිංචි වාසලලියන මුදියන්සෙලගේ සිංගිරිමැනිකා, (2) එම පුංචිමැනිකා, (3) එම පුංචිමැනිකා .. .. | එම | 0 | 3 | 6 |
| 15 | දම්නගහවත්ත .. | ඉහලගල්වැවේ පදිංචි වාසලලියනමුදියන්සෙලගේ කිරිබන්ඩ .. | එම | 0 | 1 | 36 |
| 16*a* | තඹිරිගහවත්ත .. | (1) එම ගම පදිංචි රත්නායක මුදියන්සෙලගේ සිංගිරිමැනිකා, (2) එම පුංචිමැනිකා .. .. .. | එම | 0 | 3 | 26 |
| 12*e* | වත්තෙගාවහේනවත්ත .. | (1) එම ගම පදිංචි හේරත්මුදියන්සෙලගේ බෙවිඩ්අප්පුහාමි ගන්ආරච්චි, (2) එම පිරිස් අප්පුහාමි, (3) එම පුංචප්පුහමි විදානේ .. .. | එම | 0 | 2 | 35 |
| 12*f* | කෝන්ගහවත්තේපවුලහේන | එම .. .. .. .. | හේන | 2 | 3 | 0 |
| 16 | කෝන්ගහවත්ත .. | එම .. .. .. .. | වත්ත | 1 | 3 | 22 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් 5මස වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වෙනුව.

---

**No. 4,472, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිණීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ ජනවාරි මස 23වෙනි දිනවූ බදාදා පෙරවරු 11ට සිංහිරියේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පලහත්පත්තුවේ කිනියමකෝරලේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 46ක්.

ලංකාමැනීමේ සිතියම 1,462. ගම—ගනේගොඩ.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | පඹුරුගහමුල්ලේහේන .. | (1) හෙම්හාමිමුදියන්සෙලාගේ මුදලිහාමි, (2) එච්. ඇම්. උන්ඩිඑතනා | හේන .. | 5 | 1 | 10 |
| 1*a* | දිගුදුනුවැටියහේන .. | (1) එච්. ඇම්. සිංගිරිබන්ඩා, (2) එච්. ඇම්. ගුරුහාමි .. | එම .. | 10 | 1 | 4 |
| 1*b* | තල්ගහමුල්ලේහේන .. | එච්. ඇම්. අපපුහාමි සහ කිරිඑතනා .. .. | එම .. | 5 | 2 | 2 |
| 1*c* | පඹුරුගහමුල්ලේහේන .. | (1) හේරත්මුදියන්සෙලාගේ අප්පුහාමි, (2) එච්. ඇම්. උක්කුහාමි, (3) එච්. ඇම්. පුංචිහාමි .. .. .. | එම .. | 3 | 0 | 5 |
| 1*d* | ඉදිපිටියහේන .. | හේරත්මුදියන්සෙලාගේ පුංචිහාමි .. .. | එම .. | 4 | 1 | 18 |
| 1*e* | කහටගහමුලහේන .. | එච්. ඇම්. බන්ඩාඑතනා .. .. .. | එම .. | 4 | 1 | 0 |
| 1*f* | තවලහේන .. | (1) විරකෝන්මුදියන්සෙලාගේ රන්මැනිකා, (2) ඩබ්ලිව්. ඇම්. බැලෝසිංඤෝ .. .. .. | එම .. | 6 | 1 | 5 |
| 1*g* | හපන්ගුහේන .. | (1) හිනියහාමිමුදියන්සෙලාගේ අප්පුහාමි, (2) එච්. ඇම්. පිංහාමි, (3) කිරිඑතනා .. .. .. | එම .. | 4 | 1 | 33 |
| 1*h* | එම .. | (1) එච්. ඇම්. මුදලිහාමි, (2) කිරිඑතනා .. .. | එම .. | 1 | 3 | 29 |
| 1*i* | තල්ගහමුල්ලේහේන .. | හේරත්මුදියන්සෙලාගේ පුංචිහාමි .. .. | එම .. | 3 | 3 | 10 |
| 1*j* | වාවත්තහේන .. | එච්. ඇම්. අප්පුහාමි .. .. .. | එම .. | 2 | 2 | 18 |
| 1*k* | කෝන්ගහමුලහේන .. | (1) එච්. ඇම්. නයිදෙහාමි, (2) එච්. ඇම්. මුදලිහාමි, (3) එච්. ඇම්. සිංගිරිබන්ඩා, (4) එච්. ඇම්. ගුරුහාමි .. .. | එම .. | 2 | 2 | 33 |
| 1*l* | එම .. | එච්. ඇම්. පිංහාමි .. .. .. | එම .. | 2 | 0 | 0 |
| 1*r* | පන්ලියද්දපිල්ලෑව .. | (1) එච්. ඇම්. බබාඑතනා, (2) එච්. ඇම්. පුංචිහාමි, (3) එච්. ඇම්. අප්පුහාමි .. .. .. | එම .. | 0 | 3 | 30 |
| 1*s* | අවිරේගොමපිල්ලෑව .. | (1) එච්. ඇම්. නයිදෙහාමි, (2) එච්. ඇම්. මුදලිහාමි, (3) එච්. ඇම්. සිංගිරිබන්ඩා .. .. .. | එම .. | 0 | 2 | 0 |
| 1*t* | එම .. | (1) එච්. ඇම්. බබාඑතනා, (2) එච්. ඇම්. පුංචිහාමි, (3) එච්. ඇම්. අප්පුහාමි .. .. .. | එම .. | 0 | 2 | 16 |
| 4*a* | තිඹිරිගහමුලහේන .. | (1) වික්‍රමසිංහමුදියන්සෙලාගේ හේරත්හාමි, (2) ඩබ්ලිව්. ඇම්. රිකිඑතනා, (3) ඩබ්ලිව්. ඇම්. සිංගිරිබන්ඩා .. .. | එම .. | 3 | 1 | 33 |
| 4*e* | කදුරුගහහේන .. | අතුකෝරලගේ මැනුහාමි .. .. .. | එම .. | 3 | 2 | 4 |
| 4*f* | දම්නගහමුලහේන .. | (1) වික්‍රමසිංහමුදියන්සෙලාගේ හේරත්හාමි, (2) ඩබ්ලිව්. ඇම්. කිරිඑතනා .. .. .. | එම .. | 6 | 0 | 36 |

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 4*g* | තාවල්ලේහේන | (1) වීරකෝන්මුදියන්සෙලාගේ රන්මැනිකා, (2) ඩබ්ලිව්. ඇම්. බෙලෝසිංඤෝ | හේන | 6 | 1 | 4 |
| 4*h* | රුක්අත්තනගහහේන | (1) හිනියහාමිමුදියන්සෙලාගේ අප්පුහාමි, (2) එච්. ඇම්. පිංහාමි, (3) හේරත්මුදියන්සෙලාගේ බබාඑතනා, (4) එච්. ඇම්. පුංචිහාමි, (5) එච්. ඇම්. අප්පුහාමි | එම | 2 | 1 | 9 |
| 4*i* | වැටියහේන | (1) උක්කුවාහේනයාලාගේ පිංහේනයා, (2) යූ. කිරිහේනයා, (3) යූ. රනාහේනයා | එම | 12 | 3 | 6 |
| 4*j* | එම | යූ. කිරිහේනයා, (2) යූ. රනී, (3) යූ. රියනී, (4) යූ. උන්ගාහේනයා | එම | 9 | 2 | 30 |
| 4*k* | තවලහේන | (1) හිනියහාමිමුදියන්සෙලාගේ අප්පුහාමි, (2) එච්. ඇම්. පිංහාමි, (3) හේරත්මුදියන්සෙලාගේ බබාඑතනා, (4) එච්. ඇම්. පුංචිහාමි, (5) හේරත්මුදියන්සෙලාගේ අප්පුහාමි | හේන | 11 | 0 | 28 |
| 4*l* | මීගහමුලඉහලහේන | වික්‍රමසිංහමුදියන්සෙලාගේ රන්මැනිකා | එම | 5 | 1 | 30 |
| 4*m* | රනවරකැලේහේන | අතුකෝරලලාගේ මැනුහාමි | එම | 10 | 2 | 39 |
| 4*n* | ඉහලබෝගහමුලහේන | (1) හිනියහාමිමුදියන්සෙලාගේ ඩිංගිරිබන්ඩා, (2. එච්. ඇම්. ගුරුහාමි | එම සහ වතත | 3 | 3 | 12 |
| 4*o* | දම්නගහමුලහේන | (1) වික්‍රමමුදියන්සෙලාගේ ඩිංගිරිබන්ඩා, (2) ඩබ්ලිව්. ඇම්. කිරිබංඩා | එම | 6 | 1 | 36 |
| 4*p* | කහටගහමුලහේන | එච්. ඇම්. මුදලිහාමි | හේන | 3 | 0 | 0 |
| 4*q* | වැවගාවහේන | (1) එච්. ඇම්. කිරිඑතනා, (2) එච්. ඇම්. මුදලිහාමි | එම | 2 | 3 | 3 |
| 4*x* | පතහගාවහේන | (1) එච්. ඇම්. අප්පුහාමි, (2) එච්. ඇම්. පිංහාමි, (3) කිරිඑතනා | එම | 3 | 0 | 35 |
| 4*y* | දඹුළුවැවේහේන | (1) වික්‍රමසිංහමුදියංසෙලාගේ ජයතුහාමි, (2) ඩබ්ලිව්. ඇම් රංමැනිකා | එම | 4 | 2 | 27 |
| 4*z* | පහලබෝගහමුලහේන | හිනියහාමිමුදියන්සෙලාගේ නයිදෙහාමි | එම | 5 | 2 | 25 |
| 4*aa* | කෝන්ගහමුලහේන | (1) වීරකෝන්මුදියන්සෙලාගේ රන්මැනිකා, (2) ඩබ්ලිව්. ඇම්. බැලෝසිංඤෝ | එම | 4 | 3 | 11 |
| 4*ad* | ඉහලවැව | ආණ්ඩුව | වැව | 0 | 0 | 19 |
| 4*ac* | වැටියහේන | (1) යූ. කිරහේනයා, (2) යූ. රනී, (3) යූ. රියනී, (4) යූ. උන්ගුහේනයා | හේන | 0 | 0 | 26 |
| 19 | කදුරුගහවත්ත | (1) ඉම්යහාමිමුදියන්සෙලාගේ කිරිබන්ඩා, (2) වීරකෝන්මුදියන්සෙලාගේ රන්මැනිකා, (3) බැලෝසිංඤෝ | එම | 0 | 0 | 22 |
| 20 | අන්දරවැටියේකොටුව | (1) ඉම්යහාමිමුදියන්සෙලාගේ මැනුහාමි, (2) එම කිරිඑතනා | දුම්වත්ත | 0 | 0 | 34 |
| 4*ae* | කඩවෙලපිටිය | හිම්යහාමිමුදියන්සෙලාගේ මුදලිහාමි | දෙනිය | 0 | 0 | 22 |
| 40 | හැලඹගහහේන | (1) හේරත්මුදියන්සෙලාගේ බබාඑතනා, (2) එම පුංචිහාමි, (3) එම උන්ගුඑතනා | හේන | 0 | 1 | 29 |
| 47 | මැදපිල්ලෑව | (1) ඉම්යහාමිමුදියන්සෙලාගේ නයිදෙහාමි, (2) එම කිරිබන්ඩා, (3) එම මුදලිහාමි, (4) එම පුංචිහාමි | එම | 1 | 2 | 35 |
| 52*a* | උනපදුරගාවපිල්ලෑව | එච්. ඇම්. මැනික්හාමි | එම | 0 | 0 | 18 |
| 52*b* | කෝන්ගහමුලහේ | (1) එච්. ඇම්. ඩිංගිරිබන්ඩා, (2) එච් ඇම්. ගුරුහාමි | එම | 0 | 3 | 2 |
| 52*c* | හැලඹගහහේන | (1) එච්. ඇම්. අප්පුහාමි, (2) එච්. ඇම්. පිංහාමි | එම | 1 | 2 | 30 |
| 52*d* | දිවුල්ගහහේන | (1) එච්. ඇම්. මුදලිහාමි, (2) වික්‍රමසිංහමුදියන්සෙලාගේ ජයතුහාමි, (3) එච්. ඇම්. රන්මැනිකා | එම | 2 | 1 | 28 |
| 52*e* | මීගහහේන | අතුකෝරලලාගේ මැනුහාමි | එම | 2 | 0 | 18 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 5වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වෂ්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

නොම්මර 16,358, 16,461 සහ 16,575 දරණ මුල් සිතියම්වල 1 කොටස වශයෙන් විස්තරකර තිබෙන බස්නාහිර පලාතේ නාගරික සීමාව තුළ දෙමටගොඩ පිහිටි මෙහි පහත දක්වන ඉඩම් කොටස් ප්‍රසිඩ කටයුත්තක් සඳහා හෙවත් අශුචි වතුරෙන් සෝදා යවන වැසිකිළියක් සහ අශුචි දමන ස්ථානයක් දෙමටගොඩ පාරේ සාදන පිණිස ලබාගන්නාලෙස ක්‍රියාකරණ මෙන් වර්ෂ 1911හේ පණවනලද නොම්මර 10 දරණ ආඥාපණතේ 3වෙනි වගන්තියෙන් වෙනස්කරන්ට යෙදුන වර්ෂ 1876යේ නොම්මර 3 දරණ ආඥාපණතේ 3වෙනි වගන්තියේ පංගාඩම්වල ප්‍රකාරයට ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් තිසි ආකාර මට නියමකර තිබේ, එම ඉඩම්නම් :—

මුල් සිතියම 16,358.

| ඉඩම් කොටස්. | ඉඩමේ නම. | විස්තර. | අයිතිකමකියන්නා. | අ. | රූ. | ප. |
